www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද අධිකරනය හිටපු යුද හමුදාපතිවරයා වැරදිකරුවෙකු යයි තීන්දු කරයි

## Sri Lankan military court convicts former army commander

සුජීව අමරනාත් විසිනි

2010 අගෝස්තු 18

ශ්‍රී ලංකා යුද අධිකරනයත් පසුගිය ජනාධිපති අපේක්ෂකයකු සහ යුද හමුදා අනදෙන නිලධාරියා වූ ජෙනරල් සරත් ෆොන්සේකා "නිල ඇඳුමින් සිටිය දී සක්‍රීය දේශපාලනයේ යෙදීම" යන චෝදනාවට වරදකරුවෙකු යයි තීන්දු කලේ ය. මේ තීන්දුව අනුව ඔහුගේ හමුදා තනතුර ද පදක්කම් ද ගෞරවය ද විශ්‍රාම වැටුප ද වෙනත් පහසුකම් ද ඔහුට නැතිව යනු ඇති අතර හමුදා කඳවුරු ප්‍රදේශවලට ඇතුල් වීම ඔහුට තහනම් කෙරෙනු ඇත.

තීන්දුව දී දිනයක් ඇතුලත ආරක්ෂක ඇමති ද ප්‍රධාන ආඥාපති ද වූ ජනාධිපති මහින්ද රාජපක්ෂ උසාවි තීන්දු අනුමත කලේ ය. තීන්දුව ප්‍රතික්ෂේප කල ෆොන්සේකා තමා මෙම තීන්දුවට විරුද්ධව අභියාචනාධිකරනයට යන බව ප්‍රකාශ කර ඇත.

හමුදා අධිකරන තීන්දුව ජනාධිපති රාජපක්ෂ දෙවන වාරයක් දිනාගත් පසුගිය ජනාධිපතිවරනයෙන් ඉක්බිති කරන ලද ෆොන්සේකා අත්අඩංගුවට ගැනීම යුක්ති සහගත කිරීමට දෙන ලද දේශපාලන තීන්දුවකි. ෆොන්සේකා හිටපු හමුදා නිලධාරීන්ද ඇතුලු සහකරුවන් ගනනාවක් අත් අඩංගුවට ගනු ලැබුවේ ඔහු හමුදා කුමන්ත්‍රනයක් සැලසුම් කරමින් සිටියේ යයි චෝදනා මැද්දැවේ ය. ෆොන්සේකා රාජපක්ෂ අත්අඩංගුවට ගෙන ඔහුගේ සහෝදරයන් මරා දැමීමට කුමන්ත්‍රනය කලේ යයි ආන්ඩුව මහා පව ප්‍රචාරයක යෙදුනි. මෙම චෝදනාවට කිසිදු සාක්ෂ්‍යයක් ඉදිරිපත් කිරීමට ආන්ඩුව සමත් වී නැත.

වෙන්වූ යුද අධිකරන දෙකක චෝදනා දෙකක් ඉදිරිපත් කිරීමට පෙර ෆොන්සේකා සති දෙකක් තිස්සේ අත් අඩංගුවේ තබාගන්නා ලදී. දේශපාලනයේ නිරත වීමට අමතරව යුද අවි මිලදී ගැනීමේ දී දූෂනයේ යෙදුනේ යයි ද ඔහුට චෝදනා කරන ලදී. එපමනක් නොව හමුදාවෙන් පැනගියවුන්ට රැකවල් දීම අවි ජාවාරම්වලින් ලාභ ලබා ගැනීම සහ "මහජනයා කුපිතවන පරිදි හා භීතියට පත් කෙරෙන පරිදි ප්‍රකාශයක් කිරීම" යන චෝදනාව උඩ සාමාන්‍ය උසාවියේ ද ඔහුට විරුද්ධව චෝදනා ඉදිරිපත් කර ඇත. මෙම චෝදනාවලට ජනාධිපතිවරයාගේ සහෝදර ආරක්ෂක ලේකම් ගෝඨාබය රාජපක්ෂට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ල කිරීමට ඉඩ සලසන ප්‍රකාශයක් ෆොන්සේකා විසින් කරන ලදැයි යන චෝදනාව ද ඇතුලත්ය.

ගිය සතියේ තීන්දුව දෙන ලද්දේ කිසිදු සවිස්තර පැහැදිලි කිරීමකින් තොරව ය.

ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවිය සරලවම කියාසිටියේ යුදාධිකරනය "වෙන් වෙන් චෝදනා තුනක් මත චූදිතයා දේශපාලනයෙහි යෙදීම පරීක්ෂාවට ලක් කල බවය." එම චෝදනාවලට යුද හමුදා පනතේ 124 වගන්තිය යටතේ "ද්‍රෝහී /භක්තියෙන් තොර" වීම සහ 102 වගන්තිය යටතේ "හමුදාංකයේ හෝ වෙනත් නියෝග නොතකා හැරීම" ඇතුලත්ය.

නඩු අසන ලද්දේ දොරගුලු ලාගෙන ය. චෝදක පක්ෂය සාක්ෂි හතරක් මත පදනම් විය. හිටපු එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී ජොන්ස්ටන් ප්‍රනාන්දු, එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් සෙනෙවිරත්න, හිටපු ගුවන් තොටුපල සේවා අධ්‍යක්ෂ ගාමිනී අබේරත්න, මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.ජේ ද සිල්වා, සාක්ෂිකරුවෝ වූහ. සෙනෙවිරත්න සහ දැන් ආන්ඩුවේ ඇමතිවරයෙකු වන ප්‍රනාන්දු යන දෙදෙනාම කියා සිටියේ තමාට එජාපයේ සාමාජිකත්වය ලබා දෙන ලෙස ෆොන්සේකා ඔවුන්ගෙන් ඉල්ලා සිටි බවය. ආන්ඩුවේ සහකරුවෙකු වූ අබේරත්න තමා මෙම රැස්වීම්වලට උදව් කල බව කියා සිටියේ ය.

මුල පටන්ම ෆොන්සේකා උසාවිය පක්ෂ භජනය කරතැයි චෝදනා කලේ ය. යුදාධිකරන නඩුකාරයන් ලෙස අසුන්ගත් නිලධාරීන් තුන්දෙනාගෙන් දෙදෙනෙක් ෆොන්සේකා හමුදාපතිව සිටි සමයේ ඔහුගේ දඬුවම්වලට ලක්වූවන් ය. තුන්වැන්නා වත්මන් හමුදාපති මේජර් ජෙනරාල් ජගත් ජයසූරියගේ ඥාතියෙකු විය. ජෙනරාල් ජයසූරිය රාජපක්ෂගේ පක්ෂපාතියෙකු යයි සලකනු ලැබේ. හමුදා උසාවිය

මෙම විරෝධතා ඉවත දැමීය. යුදාධිකරනයට එරෙහිව ෆොන්සේකා සිවිල් උසාවියට කල අභියාචනා ඉවත දැමුනි.

යුදාධිකරනයේ අන්තිම දවස් තුන විත්තියේ නීතිඥයන්ගෙන් තොරව පැවැත්වීම ම මෙම අධිකරන පටිපාටියේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය අවධාරනය කරයි. විත්තියේ ජ්‍යෙෂ්ඨ නීතිඥ රියන්සි අර්සකුලරත්න ඇසෝසියේටඩ් ප්‍රෙස් ජනමාධ්‍යයට මෙසේ පැවසී යː "ඔවුහු මට සහභාගි විය නොහැකි දිනවලට යුදාධිකරනය නියම කර ගත්හ. මෙය වනාහී විධිමත් නඩු විභාගයක් නොවේ. යුක්තිය මුලුමනින් ම උල්ලංඝනය කිරීමකි."

2005 නොවැම්බරයේ දී රාජපක්ෂ තේරී පත්ව 2006 මැදදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව යුද්ධයට රට යලිත් ඇද දැමූ පසු ෆොන්සේකා රාජපක්ෂට ඉතා සමීප විය. යුද හමුදා අනදෙන නිලධාරියා වූ ෆොන්සේකා එල්ටීටීඊයට යටත් වූ ප්‍රදේශවලින් එය එලවා දැමූ මුර්ග ප්‍රහාරයන් භාරව ක්‍රියා කලේ ය. මෙම මෙහෙයුම්වලදී දහස් ගනන් සිවිල් ජනයා මරනයට සහ තුවාලවලට ගොදුරු කරන ලදී. ෆොන්සේකා යුද්ධය මෙහෙයවමින් රට දිවවූ රාජපක්ෂගේ දේශපාලන මිලිටරි කුට්ටුවේ ප්‍රධාන පුද්ගලයෙකු වූයේය.

2009 මැයි එල්ටීටීඊ පරාජයෙන් පසුව ෆොන්සේකා රාජපක්ෂ සමග දබර විය. විශේෂයෙන් නිර්මානය කරන ලද හුදෙක් ආයිත්තමක් වූ හමුදා මාන්ඩලික ප්‍රධාන තනතුරට තමා පත්කිරීම ගැන ෆොන්සේකා අමනාපව සිටියේ ය. වඩාත් පලල්ව ගතහොත් යුද්ධය අවසන් කිරීමේ සකල ගරු නම්බුවට රාජපක්ෂ අයිතිවාසිකම් කියාපෑම ගැන අමනාපව සිටි ඉහල හමුදා නිලධාරීන් තට්ටුවකගේ විරුද්ධවාදී හැඟීම් ෆොන්සේකාගේ විරුද්ධත්වය තුලින් පිලිබිඹු විය. පසුගිය නොවැම්බර් මැද දී තනතුරෙන් ඉවත් වූ ෆොන්සේකා තමා ඉක්බිති ජනවාරියේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරනයට ඉදිරිපත් වන බව ප්‍රකාශ කලේ ය.

ප්‍රධාන විපක්ෂ දෙක එනම් එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ද සැලකිය යුතු මහ ධනපති කොටසක් ද ෆොන්සේකාට සහාය දුන් නමුත් ඔහු පරාජයට පත්විය. තමාගේ පරාජය පිලිගැනීමට අකමැතිවූ ෆොන්සේකා මැතිවරන තීන්දුවට නීතිමය වශයෙන් අභියෝග කොට තමා ජයග්‍රාහකයා බව නිලවශයෙන් ප්‍රකාශ කල යුතු යයි ද ජනාධිපති ධුරය තමාට ලබා දිය යුතු යයි ද ඉල්ලා සිටියේ ය. මෙයට රාජපක්ෂ පිලිතුරු දුන්නේ විපක්ෂ සහකරුවන්ට සහ මාධ්‍යවල විවේචකයන්ට එරෙහි මර්දනයක් දියත් කිරීමෙනි. මැතිවරනයෙන් සති දෙකක් ගතවන විට ෆොන්සේකා ද අත් අඩංගුවට ගන්නා ලදී. මිලිටරි අත්අඩංගුවේ පසුවුව ද ෆොන්සේකා අප්‍රේල් මහ මැතිවරනයේ දී ජවිපෙ විසින් ගොඩනගන ලද ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයේ සාමාජිකයෙකු ලෙස තරග කොට අසුනක් දිනා ගත්තේ ය.

ෆොන්සේකා "නිලඇඳුම් දරා සිටිය දී දේශපාලනයේ නිරත වී යැයි " යන චෝදනාව අඩුම වශයෙන් කිවුවොත් වංචනික ය. ශ්‍රී ලංකාව ශතවර්ෂ කාලක් තිස්සේ සිවිල් යුද්ධයේ යෙදී සිටි තතු තුල ලංකාවේ යුද නිලධාරි තට්ටුව ගැඹුරින් දේශපාලනීකරනය වී ඇත. තමාට එක්සත් ජාතික පක්ෂයට එකතු විය හැකි දැයි ද එහි ජනාධිපති අපේක්ෂයකයා හැටියට ඉදිරිපත් විය හැකි දැයි ද ෆොන්සේකා විසින් සොයා බැලීම කිසිසේත් ම අපූරු දෙයක් වූයේ නැත.

යුද්ධය පුරාම ෆොන්සේකා යලි යලිත් දේශපාලන ප්‍රකාශ කර ඇත. ඔහු 2002 සටන් විරාම ගිවිසුම විවේචනයට ලක්කරේ ය. විපක්ෂ දේශපාලකයින් විවේචනය කලේය. යුද්ධය නැවැත්වීමට මැදිහත් වන ලෙස ඉන්දියානු ආන්ඩුවට බල කිරීම ගැන ඔහු දකුනු ඉන්දියානු තමිල්නාඩු රාජ්‍යයේ දේශපාලන නායකයන් "දේශපාලන විහිලුකාරයන්" යැයි හංවඩුගැසුවේ ය. ඔහුගේ මෙම ප්‍රකාශයන්ට ආන්ඩුව සහාය දුන් නිසා ඔහුට "දේශපාලනයේ යෙදීම" ගැන චෝදනා කිරීමට කවුරුන් හෝ කතා කලේ නැත. එල්ටීටීඊ පරාජයෙන් පසු ජනාධිපති රාජපක්ෂ ෆොන්සේකාව "මහා වීරයෙක්" යයි වර්නනා කලේ ය.

රාජපක්ෂ සහ ෆොන්සේකා අතර ඉක්බිතිව ආ කටුක විරුද්ධත්වය වඩා පලල් ප්‍රශ්න සමග වෙලී පැවතුනි. එල්ටීටීඊ පරාජය ලංවත්ම කොලඹ පාලනයට මිලිටරි ආධාර සහ මුදල් ආධාර දුන් චීනයේ බලපෑම ලංකාව තුල වැඩි වේ යයි ඇමරිකා එක්සත් ජනපදය වඩ වඩාත් කනස්සලු විය. දහස් ගනන් දෙමල සිවිල් ජනයා මැරීම හා සම්බන්ධ හමුදා මුර්ග ක්‍රියා පිලිබඳ තොරතුරු ගොඩගැසෙත් ම, රාජපක්ෂගේ යුද්ධයට සහාය දී තිබුන එක්සත් ජනපදය දැන් ආන්ඩුවට පීඩනය යෙදීම සඳහා යුද අපරාධ නඩු තර්ජනයක් නරුම ලෙස යොදා ගති.

මිලිටරිය එකදු සිවිල් වැසියකු හෝ මැරුවේ නැතැයි කියා සිටි රාජපක්ෂ යුද්ධයේ අවසාන මාස කීපය පිලිබඳ කුමන හෝ ජාත්‍යන්තර පරීක්ෂනයක් පැවැත්වීමට විරුද්ධ විය. පසුව ගතවූ වර්ෂයේ ජනවාරි සිට මැයි මුල දක්වා අඩු ගනනේ 7,000ක් සිවිල් ජනයා මරා දමන ලදැයි එක්සත් ජනපදය තක්සේරු කලේ ය. ජාත්‍යන්තර අර්බුද විචාර කන්ඩායමක වාර්තා අනුව මෙම සංඛ්‍යාව 30,000 සිට 75,000 දක්වා වේ. මිලිටරිය

එල්ටීටීඊ ප්‍රදේශ තුල රෝහල් ද ආධාර මධ්‍යස්ථාන ද සිතාමතා බෝම්බ ප්‍රහාරයට ලක් කලේ යයි චෝදනා කලේ ය.

මේ සියලුම අපරාධවල කරවටක් ගැලී සිටින ෆොන්සේකා එනමුත් තමා ජාත්‍යන්තර යුද්ධ අපරාධ විමර්ශනයකදී සාක්ෂ්‍ය දීමට සූදානම් යයි ප්‍රසිද්ධියේ කියමින් තමා වොෂින්ටනයට පක්ෂපාතී බව දන්වා ලී ය. රාජපක්ෂට වඩාත් භීතියට කරුනක් වූයේ වරද ආන්ඩුව මත පැටවීමට තමා සූදානම් යයි ෆොන්සේකා කීම ය. මිලිටරිය යුද්ධ අපරාධ කලේ නැත. එහෙත් පිටින් ආ නීති විරෝධී නියෝගයන් නිසා එවන් අපරාධ කෙරෙන්නට ඇත. මැතිවරන ව්‍යාපාරය මැද්දෑවේ දී ෆොන්සේකා සුදුකොඩි අරගෙන යටත් වීමට පැමැනි බී. නඩේසන් සහ එස් පුලිදේවන් යන ප්‍රධාන එල්ටීටීඊ නායකයන් දෙදනාට වෙඩි තබන ලෙස ආරක්ෂක ලේකම් ගෝඨාබය රාජපක්ෂ අනදුන් බවට තොරතුරු තමා අතට ලැබී ඇතැයි ප්‍රකාශ කලේ ය. මෙම සිද්ධිය 2009 මැයි මාසයේ දී බ්‍රිතාන්‍ය පුවත්පත් විසින් වාර්තා කොට තිබුනි. ෆොන්සේකාගේ චෝදනාවලට මෘග ප්‍රතිචාර දැක්වූ රාජපක්ෂ බෑයෝ ෆොන්සේකා රාජ්‍ය රහස් හෙලිදරව් කලේ යයි චෝදනා එල්ල කලේය. තමා කියූ දේ නිවැරදිව වාර්තා කොට නැතැයි ෆොන්සේකා යලියලිත් කියා සිටි නමුත් ආන්ඩුව දිගින් දිගට ම සුදුකොඩි සිද්ධිය අවුස්සමින් සිටී.

ෆොන්සේකා නිශ්ශබ්ද කිරීමට ජනාධිපති රාජපක්ෂට ඇති අධිෂ්ඨානයට හේතුව නම් යුද අපරාධ පිලිබඳ කිසිදු විස්තරයක් හෝ එලිදරව් වෙතැයි ඔහුට ඇති භීතිය ය. ෆොන්සේකා වරදකරුවෙකු කොට තීන්දු කිරීම ට තවත් හේතුවක් ආන්ඩුවට තිබේ. එය නම් කොතරම් සීමා සහිත දේශපාලන විරුද්ධත්වයක් හෝ විවේචනයක් වුව කෙසේ හෝ පාගා දැමීමට රාජපක්ෂ දරමින් සිටින්නා වූ ප්‍රයත්නයයි. රාජපක්ෂ සහ ඔහුගේ සන්ධානය ජනාධිපති වරනය හා පාර්ලිමේන්තු මැතිවරනය පහසුවෙන් දිනුව ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝග පරිදි ආන්ඩුව ක්‍රියාත්මක කරන කප්පාදු නියෝගයන් කෙරේ දැවැන්ත මහජන විරෝධයක් රටපුරා මෝදු වෙමින් පවතී.

එජාප සහ ජවිපෙ දෙපක්ෂය ම ෆොන්සේකාට විරුද්ධ තීන්දුව හෙලා දැක ඇත. පසුගිය සිකුරාදා ජවිපෙ සහ ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය (ප්‍රජාස) විසින් ෆොන්සේකා නිදහස් කරන ලෙස ඉල්ලා ගාල්ලේ දී සංවිධානය කරන ලද පෙලපාලියක් පොලිසිය විසින් ප්‍රචන්ඩ බලය යොදා කඩාකප්පල් කරන ලදී. 2000ක් පමන පෙලපාලි කරුවන්ට පොලීසිය කඳුලුගෑස් සහ බැටන් ප්‍රහාර එල්ල කලේ ය. එම ප්‍රහාරය පිලිබඳව පැමිනිල්ලක් කිරීමට ගිය විජිත හේරත් සහ අජිත් කුමාර යන ජවිපෙ මන්ත්‍රීන් දෙදෙනා පොලිසියේ දී අත්අඩංගුවට ගන්නා ලදී. හේරත් සහ කුමාර සඳදා නිදහස් කරනු ලැබූ නමුත් තවත් 16 දෙනෙක් අගෝස්තු 20 දක්වා රිමාන්ඩ් භාරයේ පසුවෙති.

ආන්ඩුව මෙන් ම විපක්ෂයේ පක්ෂ දෙක ද සිංහල වර්ගවාවාදී ගොහොරුවේ ගිලී සිටිති; ෆොන්සේකා "යුද විරුවෙකු" යයි කියමින් වර්නනා කරති. රාජපක්ෂ ආන්ඩුව මෙන්ම ෆොන්සේකා ද වර්ගවාදී යුද්ධයට ද යුද හමුදාවේ අපරාධවලට ද සෘජුව වගකිව යුතු ය. එපමනක් නොව ඡන්ද ව්‍යාපාරවලින් ෆොන්සේකා සහ විපක්ෂයේ පක්ෂ පැහැදිලි කලේ රටේ ගැඹුරුවන්නා වූ ආර්ථික අර්බුදයේ බර මහජනයාගේ කර මත පැටවීමට ඔවුන් ද සූදානම් බවය.

ඒ එසේ වුව ද ෆොන්සේකාට එරෙහි නඩු තීන්දුව කම්කරු පන්තියට බරපතල අනතුරු හැඟවීමකි. රටේ ප්‍රධාන ජෙනරාල්වරයා බොරු චෝදනා මත අත්අඩංගුවට ගෙන සිරකොට වැරදිකරු කොට ලීමට සූදානම් ආන්ඩුව තමන්ගේ ධනේශ්වර ගැති ආර්ථික පිලිවෙත් වලට එරෙහි මහජනයාගේ කැරලිකාරිත්වය මැඩීමට කොතරම් නම් නපුරු ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම යොදාගනු ඇත්ද යන්න කම්කරුවන් විසින් සිතා බැලිය යුතුව ඇත.

© www.wsws.org